2019.07.16 අද පිටුව 1,4

## පාස්කු ප්‍රහාර වන්දි ලෙස

# මියගිය 191ක් වෙනුවෙන් වන්දි

ඉන්දික හේවාවිතාරණ

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මියගිය පිරිසෙන් පුද්ගලයන් එකසිය අනුඑක්දෙනෙකුට රුපියල් මිලියනය බැගින් වන්දි ලබාදී තිබෙන බව හානි පූර්ණ කාර්යාලය පවසයි. >>P4

## පාස්කු ප්‍රහාර වන්දි ලෙස...

මීට අමතරව ලිපි ලේඛනවල තිබෙන අඩුපාඩු නිසා අදාළ වන්දි මුදලින් ලක්ෂ 09 බැගින් පුද්ගලයන් හයදෙනෙකුට වන්දි ලබාදී තිබෙන බවත්, තවත් දෙදෙනෙකුට වන්දි මුදල්වලින් කොටසක් ලබාදී තිබෙන බවත් එම කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මහතා සඳහන් කළේය.

පාස්කු ප්‍රහාරයෙන් මියගිය ප්‍රමාණය මේ වනවිට දෙසිය හැටතුනක් දක්වා ඉහළ ගොස් තිබෙන බවත්, එම පිරිසෙන් හතළිස් තුන්දෙනෙකු විදේශීය ජාතිකයන් බවත් ඒ මහතා පවසා සිටියේය.

එසේම පුද්ගලයන් 19 දෙනෙකුගේ ලිපි ලේඛන කටයුතුවල පවතින ගැටලු හේතුවෙන් වන්දි මුදල් ලබාදී නොමැති බවත්, පාස්කු ප්‍රහාරය නිසා තුවාල ලැබූ ප්‍රමාණය මේ වනවිට පන්සියදෙකක් වන අතර, එම පිරිසෙන් හාරසිය එකොළහකට වන්දි ලබාදී තිබෙන බවත් අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

පාස්කු ප්‍රහාරය සිදු වී මාස දෙකකට ආසන්න කාලයක් ගත වී තිබියදීත්, පාස්කු ප්‍රහාරය නිසා තුවාල ලැබූ බවට ලිපි ලේඛන ඉදිරිපත් කරන බවද 'අද' කළ විමසීමකදී ඒ මහතා පැවසීය.

මියගිය පුද්ගලයන් වෙනුවෙන් මේ වනවිට රුපියල් මිලියන එකසිය අනූඅටයි දශම පහක් වන්දි වශයෙන් ලබාදී තිබෙන බවත්, තුවාල ලැබූවන් වෙනුවෙන් රුපියල් මිලියන හැටහයයි දශම තුනක වන්දි ලබාදී තිබෙන බවත් අධ්‍යක්ෂවරයා පවසා සිටියේය.

එසේම පාස්කු ප්‍රහාරය නිසා මියගිය කිහිප දෙනෙකුගේ ශරීර කොටස් රෝහල්වල තැන්පත් තිබෙන බවත්, ඒවා පවුලේ ඥාතීන් හඳුනාගත් පසු වන්දි ලබාදෙන බවත් ඒ මහතා වැඩිදුරටත් පැවසීය.